# දේශීය ලේඛන ඉතිහාසය සහ එහි වැදගත් සන්ධිස්ථාන

චන්ද්‍රසිරි රාජපක්ෂ

## හැඳින්වීම

ලේඛන ඉතිහාසය භාෂණ ඉතිහාසය තරම් පැරණි වූවක් නොවේ. මානවයා ලේඛනයට හුරුවූයේ අදහස් ප්‍රකාශනයට හුරු වී දීර්ඝ කාලයකට පසුවය. මෑතක් වන තුරු ම සමහර ජාතීන්ට කථිකා භාෂාවක් මිස ලිඛිත ක්‍රමයක් නොතිබීමෙන් එය පසක් වේ. එබැවින් ලේඛනය වර්ධනය වී ඇත්තේ එක් අනසින් කලාවක් ලෙසටය. කාලය හා දුර ජය ගැනීමේ උපක්‍රමයක් ලෙස ද ලේඛන කලාව භාවිත වේ. අනෙක් අතට මානව සමාජයේ අන්තර් සම්බන්ධතාවය ඇතිවන්නේ භාෂාව මාධ්‍ය කරගෙනය. 'භාෂාව නොමැතිව මනුෂ්‍යත්වයක් හෝ ලිඛිත භාෂාවක් නොමැතිව සභ්‍යත්වයක් හෝ නැති බව සමහර විද්‍යාඥයන් ප්‍රකාශ කොට ඇත්තේ එම නිසාය' (ජයසේකර,1970:125).

ලේඛනය ආරම්භ වූයේ චිත්‍ර-රේඛා- සටහන්- සංකේත- සංඥා ආදී ප්‍රකාශන විධි ක්‍රමයන් හි සංවර්ධිත අවස්ථාවක් ලෙසටය. එහි වර්ධනීය බව මිනිසා විසින් ලේඛනය සඳහා අක්ෂර සංකේත සකස්කර ගැනීමෙන් පැහැදිලි ය.

ශ්‍රී ලංකාවේ ලේඛන ඉතිහාසය විමර්ශනය කරන විට පැහැදිලිවන්නේ දූරාතීතයේ සිට ම ලේඛන සම්ප්‍රදායක් ගොඩනගා ගැනීමට අවශ්‍ය වූ පසුබිම පැවති බවයි. ඉන්දියාවේ ලේඛන සම්ප්‍රදායේ ආභාසය අනිවාර්යයෙන් ම ශ්‍රී ලංකාවට බලපෑ බව පෙනෙයි. එහි වර්ධනීය අවස්ථාව වළගම්බා රජු දවස මාතලේ අලුවිහාරයේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪවීමෙන් පැහැදිලිය. ශ්‍රී ලංකාවේ ලේඛන ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයක් ලෙස මෙය න කළ හැකිය. ඉන්දියාවේ ද සංස්කෘත ආදී ග්‍රන්ථ මේ වන විට ග්‍රන්ථාරූඪ වී තිබුණු බවට සාක්ෂි තිබේ (සන්නස්ගල,1961:35). මැටි බඳුන්වල, ගල්කණුවල, කොළවල වචන කිහිපයක් පමණක් ලියමින් ඇරඹුන ලේඛන කලාව ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪවීමෙන් පසු නව මඟකට එළඹි බව පෙනේ. වළගම්බා රජු දවස ත්‍රිපිටකය පමණක් නොව අටුවා ග්‍රන්ථ සම්පාදනයවීම ද විශේෂ සිද්ධියකි (මහාවංශය,1931:පරි:33). අනුරාධපුර සමයේ දී සංස්කෘත පොතපත සිංහලට පෙරළීමත්, අටුවා විවරණ ග්‍රන්ථ බිහිවීමත් තුළින් ලේඛන සම්ප්‍රදායේ දියුණුව මැනගත හැකිය.

පොළොන්නරුව, දඹදෙණිය, කෝට්ටේ ආදී යුගවල දී සිංහල, පාලි, සංස්කෘත, දෙමළ ග්‍රන්ථ රැසක් බිහිවීමෙන් ද අධ්‍යයන ආයතනවල ශාස්ත්‍රීය කටයුතුවලින් ද ලේඛන ඉතිහාසයේ වර්ධනීය අවස්ථා පෙන්නුම් කරයි (සන්නස්ගල,1976). විශේෂයෙන් කෝට්ටේ යුගයේ දී බිහි වූ පොතපත මෙන් ම ශාස්ත්‍රීය උදෙයෝගය විදේශිකයන් අතර ප්‍රචලිතවීම හා ශ්‍රී ලංකාවට ඔවුන්ගේ සම්ප්‍රාප්තියත් මේ සඳහා නිදසුන් ලෙස දැක්විය හැකිය.